දුරකථන / தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍ය / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල් / ஈ-மெயில் / E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

ඉසුරුපාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.
இசுருபாய ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை,
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல / Your No. } ..............................

මගේ අංකය / எனது இல. / My No } ඊඩී/01/11/01/04 ආගමික හා සාරධර්ම අංශය

දිනය / திகதி / Date } 2012/10/05

චක්‍රලේඛ අංකඃ 2012/37

සියලු පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු කොට්ඨාස භාර නි.අ.අ./ ස.අ.අ.වරුන්,
සියලු විදුහල්පතිවරුන්

# ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාව

## හැඳින්වීම

සෑම ළමයෙකුම සතුවිය යුතු ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමේ මූලික අයිතිවාසිකම සුරක්ෂිත වන පරිදි ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අදාළව ළමා අයිතිවාසිකම් සුරකිමින් ඔවුන්ගේ පෞරුෂයේ පරිපූර්ණ සංවර්ධනයට දායකවීම සෑම ගුරුවරයකුම සතු වගකීමකි.

ගුරුවරුන් යනු ශිෂ්‍යයින්ගේ ස්ථානීය දෙමාපියන් (Loco – Parents) නම් වූ නීතිමය සංකල්පයට අනුව ශිෂ්‍යයින්ගේ සුභ සිද්ධියට හේතුවන අයුරින් කටයුතු කිරීමට සෑම ගුරුවරයෙකුම බැඳී සිටී.

වෘත්තීය විශිෂ්ටත්වය තහවුරු වන අයුරින් හා මහජනතාව තමන් වෙත දක්වන ගෞරවය වර්ධනය වන අයුරින් වෘත්තීය චර්යාවන් තමන් විසින්ම සකස්කර ගැනීමට යොමුවීම වෘත්තීයභාවයේ අවශ්‍යතම උපාංගයක් වේ.

ස්වකීය කාර්ය භාරය ඉටු කිරීමේදී ගනු ලබන විනිශ්චයන් අරභයා තමන් විසින් භුක්ති විඳින අසීමිත ස්වාධීනත්වය හේතු කොට ගෙන චර්යාමය ප්‍රමිතීන් තමන් විසින්ම පනවාගෙන ඒ අනුව කටයුතු කිරීම අතිශයින් වැදගත්වේ.

සමාජ පද්ධතියේ සක්‍රිය කොටස්කරුවෙකු ලෙස ගුරුවරයා සතු කාර්ය භාරය සහ ගුරු වෘත්තියේ වෘත්තීයමයභාවය හඳුනාගැනීමට මඟපෙන්වීමටත් ගුරුවරයෙකු සතුවිය යුතු ස්වයං මඟපෙන්වීම හා ස්වයං විනයෙහි වැදගත්කම හඳුන්වාදීමටත් විවිධ කාල වකවානුවල දැරූ උත්සාහයන්හි නිමවුම්ද ආධාර කරගනිමින් ස්වයං ආචාර ධර්ම පද්ධතියකට මඟ පෙන්වීමක් ලෙස මෙම ආචාර ධර්ම පද්ධතිය සකසා ඇත.

ඒ අයුරින් සෑම ගුරුවරයෙකු විසින්ම පිළිපදිනු ඇතැයි අපේක්ෂිත වෘත්තීය සුචරිත නීති මාලාවක් ආචාර ධර්ම පද්ධතිය ඇසුරින් ගොඩනගා ඇත.

ගුරු වෘත්තිය සඳහා වෙනම ආයතනයක් පිහිටුවා ගන්නා තෙක් මෙම ආචාර ධර්ම පද්ධතිය හා නීති මාලාව ගුරුවරුන් ඇගයීමට හා සම්මානයට පාත්‍ර කිරීමේ උපකරණයක් ලෙසත් පාසල් පද්ධතියේ ගුණාත්මක භාවය සංවර්ධනය කිරීමේ උපකරණයක් ලෙසත් භාවිත කළ හැකිය.

පිළිගත් ආචාර ධර්ම පද්ධතියක් හා නීති මාලාවක් මගින් ගුරු වෘත්තියේ අභිමානය ආරක්ෂා කිරීමත් එම නීති රීති සිතා මතා උල්ලංඝනය කරන්නන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමේ පදනමක් ගොඩනැගීමත් මෙයින් අපේක්ෂා කෙරේ.

ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳව ආචාර ධර්ම පද්ධතියේ හා නීති මාලාවේ දක්වා ඇති තත්ත්ව, න්‍යායන් සහ වගන්ති ඒ සඳහා දී ඇති අංක අනුව අවශ්‍ය වූ විට උපුටා දැක්විය හැකිය.

## 1.0 නිල නාමය

මෙම ලේඛනය ගුණාත්මක අධ්‍යාපන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා වූ ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාරධර්ම පද්ධතියක් හා නීතිමාලාවක් ලෙස හැඳින්විය හැකිය. ඉදිරියට මෙය ඒකාබද්ධව හෝ වෙන් වෙන්ව සඳහන් කරනු ඇත්තේ පොදු නීති මාලාව හෝ ආචාරධර්ම පද්ධතිය යනුවෙනි.

## 2.0 පද නිර්වචනය

ගුරුවරයා යනුවෙන් මෙහි අදහස් කරනු ලබන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය පිළිබඳව වගකීමට බැඳී සිටින පාසල් ගුරුවරුන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය වේ.

සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාරධර්ම පද්ධතිය ලෙස හඳුන්වන්නේ, තමන් විසින්ම තමන් සඳහා පනවා ගත යුතු අවංකත්වය, වගකීම, ඍජු බව සහ ආදර්ශවත් සමාජ වගකීම ඇති පුද්ගලයින් වශයෙන් ගුරුවරුන්ගෙන් සමාජය අපේක්ෂා කරන ආකල්ප, වගකීම සහ චාරිත්‍ර වාරිත්‍රය.

නීති මාලාව යනුවෙන් හඳුන්වන්නේ සියලු ගුරුවරුන් විසින් අනිවාර්යයෙන් පිළිපැදිය යුතු නීති රීති සමුදායයි.

## 3.0 අරමුණු:-

ගුරුවරුන් සඳහාවූ මෙම සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා නීති මාලාව අරමුණු 02කින් සමන්විත වේ.

I. අවංකකමින්, වගකීමෙන්, වෘත්තීයමය ඍජු බවින් සහ ආදර්ශවත් සමාජයීය වගකීමෙන් යුත් පුද්ගලයින් වශයෙන් ගුරුවරුන් විසින් අනුගමනය කිරීම සඳහා සදාචාරාත්මක ප්‍රමිතීන් පද්ධතියක් ආචාර ධර්ම පද්ධතියක් ලෙස ඉදිරිපත් කිරීම.

II. විනයානුකූල ක්‍රියා සඳහා සියලු ගුරුවරුන්ට වගකීම පැවරෙන ආකාරයේ නීති මාලාවක් ඉදිරිපත් කිරීම.

## 4.0 පොදු පරමාර්ථ හා මූලධර්ම

පිළිපැදිය යුතු නීති මාලාවක් සහිතව ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීමේ පරමාර්ථය වනුයේ වැදගත් වෘත්තියක සාමාජිකයින් ලෙස ගුරුවරුන්ගේ ගෞරව නාමය ආරක්ෂා කිරීමය. මෙම ආචාර ධර්ම පද්ධතිය මගින් ගුරුවරුන් විසින් ස්වේච්ඡාවෙන් තමන් වෙත පනවා ගතයුතු චර්යා ප්‍රමිතීන් සකස් කරන ලද්දේ වුවද මෙම ප්‍රමිතීන් සේවා උසස් කිරීම් සහ ජාතික වශයෙන් පිළිගැනීම සඳහා ගුරු කාර්යය සාධනය තක්සේරු කිරීම පිණිසද යොදා ගත හැකිය.

## 5.0 සදාචාරාත්මක හැසිරීම පිළිබඳ වූ ගුරු ආචාර ධර්ම පද්ධතිය

සදාචාරාත්මක හැසිරීම පිළිබඳ වූ ගුරු ආචාර ධර්ම පද්ධතියට පුළුල් වශයෙන් අයත් වන්නේ තමන් විසින්ම තමන් වෙත පනවා ගතයුතු අවංකත්වය, වගකීම, ඍජු බව සහ ආදර්ශවත් සමාජ වගකීම ඇති පුද්ගලයන් වශයෙන් ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරන ආකල්ප වගකීම් සහ චාරිත්‍ර වාරිත්‍රය.

මෙහිදී ක්ෂේත්‍ර 8 ක් ඔස්සේ ආචාර ධර්ම පද්ධතිය ගොඩනගා ඇත.

## 5.1 ගුරුවරයා පුද්ගලයෙකු වශයෙන්,

යහ පැවැත්ම විනය හා යහපත් චර්යාවෙන් යුතු ආදර්ශවත් සමාජ නියමුවෙකු ලෙස ගුරුවරයෙකුගෙන් පහත සමාජ අපේක්ෂාවන් ඉටු විය යුතුය.

(අ) තමා මනා සෞඛ්‍යයෙන් සිටීමට අවශ්‍ය පිළිවෙත් අනුගමනය කරමින් ශරීර ස්වස්ථතාව සහ පිරිසිදු බව පිළිබඳ සම්මතයන් පිළිපැදීම.

(ආ) සැමවිටම විනීත හා සංවර භාවය රැකෙන පරිදි සංස්කෘතියට අනුකූල වූ, පිරිසිදු, චාම් මනා පිළිවෙළට සැකසූ ඇඳුමින් සැරසී සිටීම.

(ඇ) මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය, දුම්පානය, බුලත්විට සැපීම වැනි අහිතකර පුරුදුවලින් හා විවිධ අපචාරවලින් වැළකී සිටීම සහ අන් අයට එසේ වැළකී සිටීමට අනුබල දීම.

(ඈ) පෞද්ගලික හා සාමාජික හැසිරීම පිළිබඳව අපකීර්තියට ලක්වූ පුද්ගලයින් ආශ්‍රය නොකිරීම.

(ඉ) තමන් ඇසුරු කරන ගුරුවරුන්, සිසුන් හා අන් අය ඉදිරියේ තමන්ගේ ධනවත්කම, පවුල් සම්බන්ධතා හා උසස් තිලතල දරන පුද්ගලයන් ආශ්‍රය පිළිබඳව පුරසාරම් නොදෙඩීම.

(ඊ) තමන්ගේ ධනය, පවුල් සම්බන්ධතා සහ උසස් තිලතල දරන පුද්ගලයන් සමඟ ඇති හිතවත්කම් අනෙක් ගුරුවරුන්, සිසුන්, වෙනත් පුද්ගලයන් බිය ගැන්වීමට හෝ ඔවුන්ට හානියක් සිදු කිරීමේ අදහසින් ප්‍රයෝජනයට නොගැනීම හා එසේ කටයුතු කරන පුද්ගලයන් ඉදිරියේ අදීනව හැසිරීම.

(උ) තම පුද්ගලික ජීවන දර්ශනය හෝ ආගම, දේශපාලන මතය ආදී කරුණු සම්බන්ධව තම පුද්ගලික මතවාද පිළිගැනීමට සිසුන් පෙලඹවීමෙන් වැළකීම.

(ඌ) කිසියම් විෂයයක්, භාෂාවක් හෝ වෙනත් ක්ෂේත්‍රයක් පිළිබඳව තම සුවිශේෂී හැකියාවන් අන් ගුරුවරුන් හෙළා දැකීම පිණිස යොදා නොගැනීම.

(එ) මතවාදී පුද්ගලයින් ඉදිරියේ අන්තවාදී නොවීම හා අන්තවාදී ස්ථාවරයන් බැහැර කරමින් සමබර පුද්ගලයකු ලෙස මනාව හැසිරීම.

(ඒ) අසාධාරණය. අයුතු ලෙස කොන්කිරීම සහ බිය වැද්දීම, ඉදිරියේ තමන්ගේ සහෝදර ගුරු භවතුන්, සිසුන් හෝ වෙනත් අයෙකු ආරක්ෂා කරගැනීමට සැමවිටම සූදානමින් සිටීම.

(ඔ) පන්ති කාමරයේ සහ ඉන් බාහිරව සිසුන් සමග කටයුතු කරන අවස්ථාවලදී ජංගම දුරකථන භාවිතයෙන් වැළකී සිටීම.

(ඕ) සැමවිටම සමාජ සම්මතයන්ට ගරු කරමින් සිරිත් විරිත් ගති පැවතුම් හා පෞද්ගලිකත්වය ආදී සෑම ආකාරයකින්ම දරුවන්ට සහ සමස්ත සමාජයට ආදර්ශයක් වන පරිදි හැසිරීම.

(ඖ) මිනිසුන් හෝ සතුන් පිළිබඳව සාහසික ක්‍රියාවක් සිදුවන අවස්ථාවක තමන්ගේ සංවේදීතාව පෙන්වා ක්‍රියාකිරීම හා ස්වාභාවිකව හෝ මිනිසා විසින් කරනු ලබන ක්‍රියාවක් නිසා හෝ උදාසීනත්වය, නොසැලකිල්ල නිසා හෝ පීඩාවට පත් අයට සහකම්පනය දක්වමින් උදව් උපකාර කිරීම.

## 5.2 ගුරුවරයා "දෙමව්පියන් වෙනුවට"

"පාසල් ශිෂ්‍යයින් සම්බන්ධයෙන් ගුරුවරයා ශිෂ්‍යයින්ගේ ස්ථානීය දෙමාපියන් නම් වූ නීතිමය සංකල්පය සැලකිල්ලට ගෙන,

(අ) සැමවිටම දෙමාපියන් හා දරුවන් තමාවෙත තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීම හා දෙමාපිය භාරකරුවන් කෙරෙහි දරුවන්ගේ විශ්වසනීයත්වය තහවුරු වන ආකාරයට කටයුතු කිරීම.

(ආ) කුලය, විශ්වාසයන්, ස්ත්‍රී-පුරුෂභාවය, සමාජ තත්ත්වය, ආගම, භාෂාව, උපන් ස්ථානය යන සාධක නොසලකා හැර සියලු සිසුන්ට සාධාරණව හා අපක්ෂපාතීව ආදරය, සැලකිල්ල හා ආරක්ෂාව සැපයීම.

(ඇ) තම සිසුන්ට ඔවුන්ගේ නමින් හෝ දුව, පුතා ලෙසින් පමණක් ආමන්ත්‍රණය කිරීම.

(ඈ) ශිෂ්‍යයින්ට පැවතිය හැකි විශේෂ අවශ්‍යතා, ගැටළු සම්බන්ධව විමසිලිමත්ව සිටීම හා එවැනි සිසුන්ට අවශ්‍ය පහසුකම් සැලසීමටත් අවශ්‍ය පරිදි විශේෂඥ උපදෙස් ලබා දීමටත් කටයුතු කිරීම.

## 5.3 ගුරුවරයා දැනුම ලබා දෙන්නෙකු, කුසලතා හා ආකල්ප සංවර්ධනය කරන්නෙකු ලෙස,

දැනුම ලබාදීම, කුසලතා හා යහපත් ආකල්ප සංවර්ධනය කිරීම ගුරුවරයාගේ මූලික වගකීම ලෙස සලකා ගුරුවරයා පහත සඳහන් ආකාරයට කටයුතු කරනු ඇත.

(අ) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ (1989) ප්‍රකාරව ළමයින් සතු අයිතීන් (විශේෂයෙන් අධ්‍යාපනය ඇතුළුව) තහවුරු වනසේ කටයුතු කිරීම.

(ආ) සැමවිටම මනා සූදානමකින් තම වගකීම ඉටුකිරීම.

(ඇ) ලබාදෙන දැනුම නිවැරදි බවත්, අදාළ බවත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට යෝග්‍ය බවත් සහතික කිරීම.

(ඈ) විෂයයන් ඉගැන්වීම සම්බන්ධයෙන් සාකල්‍යවාදී (Holispic) ප්‍රවේශයන් අනුගමනය කිරීම.

(ඉ) ඉගැන්වීම් කාලය තුළ ප්‍රශ්න ඇසීමට හා සාකච්ඡා කිරීමට උනන්දු කරවීම තුළින් සිසුන්ගේ විචාරාත්මක චින්තනය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීම.

(ඊ) පාඩමට අදාළ අතිරේක තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය සිසුන්ට ඒ සඳහා තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයන් පැහැදිලි කර දීම හා තමන්ගෙන් වැඩිදුර තොරතුරු විමසීමට අවකාශ ලබා දීම.

(එ) සිසුන් ස්වයං අධ්‍යයනයට පෙලඹවීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

(ඒ) සිසුන්ගේ ආකල්ප වර්ධනය කරන්නෙකු සහ ඒ සඳහා පොලඹවන්නෙකු ලෙස ක්‍රියා කිරීම.

(ඔ) කිසිවිටකත් තම සිසුන්ගෙන් මුදල් අයකර ගෙන ඉගැන්වීමේ නොයෙදීම.

## 5.4 ගුරුවරයා නිර්මාණාත්මක මඟ පෙන්වන්නෙකු සහ උපදේශකයෙකු ලෙස,

නිර්මාණාත්මක මඟ පෙන්වන්නෙකු සහ උපදේශකයෙකු ලෙස තමන් භාරයට පත්වන ශිෂ්‍යයින් සඳහා අනර්ඝ සේවයක් ගුරුවරයකුගෙන් ඉටු විය යුතු බැව් සලකා,

(අ) එම වගකීම ඉටු කරනු පිණිස දැනුමෙන්, කුසලතාවන්ගෙන් හා යහපත් ආකල්පයන්ගෙන් යුතුව මනාව සූදානම් වීම.

(ආ) ශිෂ්‍යයින්ට තිබිය හැකි දුබලතා හා ගැටලු සම්බන්ධව විමසිලිමත්ව සිටිය යුතු අතර එවැනි ගැටලු නිරාකරණයට අවශ්‍ය විශේෂඥ උපදෙස් ලබා දීමට පියවර ගැනීම.

(ඇ) සිසුවකු සම්බන්ධ දුබලතා හෝ ගැටලු පිළිබඳ රහස්‍ය තොරතුරු එම සිසුවාගේ දෙමාපියන් හා නීත්‍යානුකූල භාරකරුවන් හැර වෙනත් අයට හෙළි නොකිරීම.

(ඈ) දෙමාපියන් සමඟ සුහද සම්බන්ධතාවක් පවත්වා ගනිමින් අවශ්‍ය අවස්ථාවලදී ඔවුන්ට තම දරුවා සම්බන්ධ ගැටලු නිරාකරණය සඳහා තමන් වෙත පහසුවෙන් ළඟාවීමට අවස්ථාව සලසා දීම.

(ඉ) කිසිවිටකත් ගුරු සිසු සම්බන්ධතා අනිසි ලෙස ප්‍රයෝජනයට නොගැනීම හා සිසුන් අපචාරයන්ට හා අපයෝජනයට ගොදුරුවීමට ඇති අවස්ථාවලින් වළක්වා ගැනීමට කටයුතු කිරීම.

(ඊ) සැමවිටම සිසුවාගේ දැනුම, කුසලතා හා සමාජ සාරධර්ම සංවර්ධනයට කටයුතු කිරීම.

## 5.5 ගුරුවරයා ඇගයීම් කරන්නෙකු ලෙස,

තක්සේරුව හා ඇගයීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ වැදගත් අංග සේ සලකා ගුරුවරයා විසින්,

(අ) නිරන්තරයෙන් ඒ සඳහා අවශ්‍ය දැනුම යාවත්කාලීන කර ගැනීම සහ ඒ හා සබැඳි තම දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනය කර ගැනීම.

(ආ) ශිෂ්‍යයන් තුළ තිබිය හැකි ඉගෙනුම් දුබලතා සහ ගැටලු පිළිබඳව විමසිලිමත්ව සිට ඒවාට පිළියම් යෙදීම සඳහා අවශ්‍ය විශේෂඥ උපදෙස් ඇතුලුව සියලු පියවර ගැනීම.

(ඇ) සිසුන් කෙරෙහි කිසිම භේදයකින් හා පුද්ගල බද්ධතාවයකින් තොරව විනිවිද භාවයකින් හා විශ්වසනීයත්වය ගොඩනැගෙන පරිදි ඇගයීම් කටයුතු කිරීම.

## 5.6 ගුරුවරයා වෘත්තිකයෙකු ලෙස,

න්‍යායික දැනුම හා කුසලතා සම්භාරයක් අත්පත් කර ගැනීම හේතුවෙන් ගුරුවරයා වෘත්තිකයෙකු ලෙස සලකනු ලබන හෙයින්,

(අ) ගුරු වෘත්තියට ආවේණික වූ උසස් සම්ප්‍රදායන් හා උත්තරීතර භාවය සෑමවිටම ආරක්ෂා කිරීම.

(ආ) තමන්ගේ වෘත්තීය දැනුම හා කුසලතා වලංගුව තබා ගැනීම මෙන්ම යාවත්කාලීන කරගනු ලැබීම අනිවාර්ය වේ.

(ඇ) ඉගැන්වීම වෘත්තියක් සේ සැලකීම රඳාපවතින්නේ ගුරු ප්‍රජාව තුළ අවශ්‍ය දැනුම, කුසලතා,ආකල්ප තිබීමත්, ගුරුවරයා තම දැනුම, කුසලතා, ආකල්ප අන් අය සමග බෙදා ගැනීමත් සියලු ගුරුවරුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය සඳහා උද්‍යෝගයෙන් යුතුව සහයෝගය දැක්වීමත් මතය.

(ඈ) ගුරුවෘත්තියට අවශ්‍ය සුදුසුකම් නොමැතිවීමෙන් වෘත්තිය අපකීර්තියට පත්වන බැවින් ගුරුවරයා විසින් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සහ සහෝදර ගුරුභවතුන්ගේ සේවා අභිවෘද්ධිය සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

(ඉ) අවශ්‍ය සුදුසුකම් හා නිපුණතා නොමැති ගුරුවරුන්ගේ ශ්‍රේණිය උසස් කිරීම වෘත්තියට හානි කර වන බැවින් ඔහු/ ඇය සුදුසුකම් සපුරන තුරු උසස්වීම් අපේක්ෂා නොකිරීම හා සුදුස්සන්ට උසස්වීම් දීමට ගන්නා වැඩ පිළිවෙළට සහාය දීම.

(ඊ) තම වෘත්තිය පිළිබඳ අභිමානයකින් හා යහ හැඟීමකින් කටයුතු කිරීම.

(උ) සියලු සිසුන් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම තුළින් මහජන විශ්වාසය දිනාගැනීම.

(ඌ) ස්වකීය පෞද්ගලික හෝ වෘත්තීය අරමුණක් හෝ ප්‍රතිලාභයක් වෙනුවෙන් ශිෂ්‍ය ප්‍රජාවගේ ජීවිතවලට හෝ ඔවුනගේ අනාගතයට අහිතකර ලෙස බලපෑ හැකි ක්‍රියාමාර්ග ගැනීමෙන් වැළකීම සහ එවැනි අසත් ක්‍රියාමාර්ග සඳහා අනුබල නොදීම.

(එ) සිසුන්, අනෙක් ගුරුවරුන්, නිලධාරීන්, දෙමාපියන් ඉදිරියේ තමා සමග සේවය කරන්නන් විවේචනය නොකරමින්, විෂය හා විෂය බාහිර සෑම ක්‍රියාකාරකමකදීම ආයතනය තුළදී සහ ඉන් පිටතදීත් මනා සහයෝගයකින් සහ සාමූහිකත්වයකින් යුතුව කටයුතු කිරීම.

(ඒ) ඉදිරි වර්ෂයේ කටයුතු සඳහා අවශ්‍ය වන ලිඛිත වාර්තා හා වාචික තොරතුරු නිසි පරිදි ස්වකීය අනුප්‍රාප්තිකයාට ලබා දීම.

(ඔ) වෘත්තියේ ගෞරවයට හානිකර අයථා තත්ත්වයන් උද්ගතවූ වහාම ඒවා අදාළ වෘත්තීය බලධාරීන්ට වාර්තා කිරීම.

## 5.7 ගුරුවරයා කළමනාකරණයේ වගකිවයුත්තෙකු ලෙස,

(අ) තම වෘත්තියට බලපාන නීතිරීති, ඉහළ කළමනාකරණය කෙරෙහි තමා සතු වගකීම් පිළිබඳව දැනුවත් වීම.

(ආ) පාසල හා සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමට හා ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

(ඇ) කළමනාකරණ උපදෙස් පිළිපැදීම හා ගැටලු සහගත අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් විධිමත්ව සන්සුන්ව ප්‍රශ්න කිරීම.

(ඈ) තම වෘත්තීයමය ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රතිඵල පිළිබඳ අන්‍යෝන්‍ය ගරු කිරීමක් ඇති කර ගැනීම.

(ඉ) සියලු රාජකාරි කටයුතු නිසි බලධාරීන් හා නිසි මාර්ගයන් මගින් සාධාරණව ඉටු කර ගැනීම.

## 5.8 සමාජයේ හා දේශයේ පෙර ගමන්කරුවෙකු ලෙස,

ගුරුවරයා නිරතුරුව සමාජයේ හා දේශයේ පෙර ගමන්කරුවෙකු ලෙස සලකනු ලබන හෙයින්,

(අ) සමාජ ගැටලු හඳුනා ගැනීම හා එම ගැටලුවලින් නිර්මාණය කරන ලද අභියෝගවලට මුහුණ දීමට හැකි ක්‍රියාකාරකම්හි දරුවන් යොදවමින් දේශ හිතෛෂී දරුපරපුරක් සමාජයට දායාද කිරීමට කටයුතු කිරීම.

(ආ) විවිධ ජන කොට්ඨාස, ආගමික හා භාෂා කොටස් අතර සාමය ගොඩ නැගෙන ආකාරයට සිසුන් තුළ යහපත් සිතුවිලි හා සාරධර්ම වගා කිරීම තුළින් ජාතික ඒකාබද්ධතාව තහවුරු වන අයුරින් කටයුතු කිරීම.

(ඇ) තම පාසලට, සමාජයට, රටට හා ජාතියට හිතෛෂීව කටයුතු කරමින් තම සිසුන් ද ඒ මගෙහි ගමන් කරවීම.

## 6.0 නීති මාලාව

මෙම ආචාර ධර්ම පද්ධතියට සියලු සාමාජිකයින් විසින් පිළිපැදිය යුතු හා උවමනාවෙන් උපදෙස් පැහැර හරින සාමාජිකයින්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියාමාර්ග ගතහැකි නීති මාලාවක් ද ඇතුළත් වේ. මෙම නීති මාලාවේ නියෝග පිළිබඳව කටයුතු කරන විට එයට දී ඇති අංකය සඳහන් කළ යුතුය.

සියලු ගුරුවරුන් විසින් පිළිපැදිය යුතු මෙම ආචාර ධර්ම පද්ධතියට අවංක භාවයෙන්, වගවීමෙන්, වෘත්තීයමය ඍජු භාවයෙන් සහ ආදර්ශවත් සමාජ වගකීමෙන් යුත් පුද්ගලයින් වශයෙන් ගුරුවරුන්ගෙන් අපේක්ෂා කෙරෙන ආකල්ප, සම්මත හා සිරිත් විරිත් ඇතුළත් වේ. පහසු පරිශීලනය සඳහා විවිධ මාතෘකා යටතේ මෙම නියෝග ගොනුකර ඇත්තේ වුවද එහි දක්වා ඇති කරුණු එක් මාතෘකාවකට පමණක් සීමා නොවනු ඇත.

## 6.1 ගුරුවරයා පුද්ගලයෙකු වශයෙන්,

මනා හැසිරීම, විනය සහ යහපත් චර්යාවෙන් යුත් පුද්ගලයෙක් ලෙස ගුරුවරයෙකුගෙන් අපේක්ෂිත සමාජ අපේක්ෂාවන්ට අනුකූලව ඔහු/ඇය විසින් පහත සඳහන් නියෝග පිළිපැදිය යුතුවේ.

(අ) සුරාසැල් සහ සූදු ක්‍රීඩා පැවැත්වෙන අපකීර්තිමත් ස්ථානයන්හි නොගැවසිය යුතුයි.

(ආ) සූදුවට, සුරාපානයට, දුම්බීමට, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයෙකු ලෙස අපකීර්තියක් ලැබෙන අයුරින් නොහැසිරිය යුතුය.

(ඇ) සෑම අවස්ථාවකදීම සංවරව හැසිරිය යුතු අතර සභ්‍ය වචන කථා කළ යුතුය.

(ඈ) මුදල් පොලියට දීම, ශරීර සෞඛ්‍යයට හා සමාජ යහපැවැත්මට අහිතකර අන්දමේ ජීවනෝපායන්හි හෝ ක්‍රියාවන්හි නොයෙදිය යුතුය.

(ඉ) ගැටුම් නිරාකරණය, මානව අයිතිවාසිකම්, ළමා හා කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ මූලධර්ම පිළිපැදිය යුතු වන අතර ළමුන් ගෘහ සේවයේ යෙදවීම, ඔවුන් අපචාරයට හා අපයෝජනයට ලක් කිරීම වැනි ඉහත මූලධර්ම උල්ලංඝනය කරනු ලබන ක්‍රියාවන්හි නිරත නොවිය යුතු මෙන්ම එවැනි ක්‍රියාවන්ට සහයෝගය දීමද නොකළ යුතුය.

## 6.2 ගුරුවරයා "දෙමාපියන් වෙනුවට"

පාසල් සිසුන් සම්බන්ධයෙන් දෙමාපියන්ගේ ස්ථානය ගුරුවරයා විසින් ගනු ලබන හෙයින් ගුරුවරයා සෑමවිටම,

(අ) ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍ය පිරිසකට විශේෂත්වයක් දැක්වීම නොකළ යුතු අතර කිසිදු භේදයකින් තොරව සැමට සාධාරණව සැලකීමත් අතිරේක අවධානය අවශ්‍ය අය සඳහා විශේෂ සැලකිල්ලක් දක්වා කටයුතු කිරීමත් කළ යුතුය.

## 6.3 ගුරුවරයා දැනුම ලබා දෙන්නෙකු, කුසලතා හා ආකල්ප වර්ධනය කරන්නෙකු ලෙස,

දැනුම ලබාදීම, ආකල්ප හා කුසලතා වර්ධනය තම මූලික වගකීම ලෙස සලකා ඉහත සඳහන් දේ ඉතා සැලකිල්ලෙන් කිරීමට ගුරුවරයා කටයුතු කළ යුතු බැවින්,

(අ) තම වගකීම ඉටු කිරීමට මනා ලෙස සූදානම් වීම.

(ආ) ලබාදෙන දැනුම, කුසලතා, ආකල්ප නිවැරදි බවත් අදාළ බවත් යොදා ගන්නා ක්‍රමවේද ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට වයස හා ස්වභාවය අනුව යෝග්‍ය බවත් සහතික කිරීම.

(ඇ) පාසල තුළදී මෙන්ම පාසලෙන් බාහිරව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳව මූළුමනින්ම සහතික වීම.

(ඈ) අතිරේක තොරතුරු සහ අතිරේක තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයන් දැනගැනීමට අපේක්ෂා කරන ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට තමන් වෙතට නොපැකිළව පැමිණීමට අවකාශ සැලැස්වීම.

(ඉ) ඍජු හෝ වක්‍රව සිය විෂයයට හෝ පාඩමට ඇතුළත් කරුණු, ශිෂ්‍ය විනය හා ශික්ෂණයට අදාළ කරුණු හැර වෙනත් නිෂ්ප්‍රයෝජන කරුණු සිසුන් සමග සාකච්ඡා කිරීමෙන් වැළකීම.

## 6.4 ගුරුවරයා නිර්මාණාත්මක මඟ පෙන්වන්නෙකු හා උපදේශකයෙකු ලෙස,

තමන්ගේ භාරයට පත් කෙරෙන ශිෂ්‍යයන්ගේ මඟ පෙන්වන්නා හා උපදේශකයා ලෙස අනර්ඝ කාර්ය භාරයක් ඉටු කිරීමට ගුරුවරයෙකුට සිදුවන බැව් සැලකිල්ලට ගනිමින්,

(අ) තම ශිෂ්‍යයින්ගේ ආත්මාභිමානයට සහ ආත්ම ගෞරවයට හානිවීමෙන් ඔවුන් තුළ ඍණාත්මක ආකල්පයක් ඇතිවීමට හේතුවන අන්දමේ ප්‍රකාශයන් කිසිම අවස්ථාවක නොකළ යුතුය.

## 6.5 ගුරුවරයා ඇගයීම් කරන්නෙකු ලෙස

තක්සේරු කිරීම හා ඇගයීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ වැදගත් මෙන්ම අත්‍යවශ්‍ය අංගයක් බැව් සලකා,

(අ) තමන් විසින් කරනු ලබන ඇගයීම හෝ තක්සේරුව සාධාරණ මෙන්ම අපක්ෂපාතී හා නිරවද්‍ය බවට සහතික විය යුතුයි.

## 6.6 ගුරුවරයා වෘත්තිකයෙකු ලෙස,

තමන් වෙත නියම කරනු ලබන හා තමන් විසින් පිළිපදිනු ලබන උසස් චර්යා ධර්ම මත ගුරු වෘත්තියේ ගෞරවය රඳා පවතින බැව් සැලකිල්ලට ගනිමින්,

(අ) උසස්වීම් ආදියේදී තමන්ට අසාධාරණයක් සිදු වී ඇතැයි සලකන අවස්ථාවන්හි පවා තමන්ගේ අයිතිවාසිකම් පමණක් ඉදිරිපත් කරමින්, තම වෘත්තියට නොගැළපෙන කටයුතුවල නොයෙදිය යුතුය.

(ආ) ගුරු වෘත්තියේ අභිමානය රඳා පවත්නේ, සියලු ගුරුවරුන් විසින් වෘත්තිය චර්යා ධර්ම පිළිපැදීම මත බැව් සැලකිල්ලට ගනිමින්, තම වෘත්තියේ අභිමානය පලුදුවන ආකාරයේ ක්‍රියාවන්හි නිරත නොවිය යුතුය.

## 6.7 ගුරුවරයා කළමනාකරණයේ වගකිව යුත්තෙකු ලෙස,

(අ) තමාට බලපාන පරිපාලන නීතිරීති, ඉහළ කළමනාකරණය කෙරෙහි තමා සතු වගකීම් පිළිබඳව මනා දැනුමක් ලබාගෙන එම කළමනාකරණ උපදෙස් පිළිපැදීම හා ගැටලු අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් විධිමත්ව සන්සුන්ව ප්‍රශ්න කිරීම

(ආ) තම වෘත්තීය ගරුත්වය ආරක්ෂා වන පරිදි තම ආයතනයේ සංවර්ධනය උදෙසා කටයුතු කිරීම.

## 6.8 සමාජයේ හා දේශයේ පෙර ගමන්කරුවෙකු ලෙස,

ගුරුවරයා සමාජයේ හා දේශයෙහි පෙර ගමන්කරුවෙකු ලෙස අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරන බව සලකා,

(අ) තම පාසලට, සමාජයට, රටට හා ජාතියට හිතෛෂීවීම හා එවැනි ශිෂ්‍ය පරම්පරාවක් ගොඩනැගීමට දායක වීම.

(ආ) ජාතික ඒකාබද්ධතාවය ඇතිවන අයුරින් සිසුන් තුළ යහපත් සිතුවිලි හා සාරධර්ම වගා කිරීම.

(ඇ) සමාජ ගැටලු හඳුනාගැනීම, එම ගැටලුවලින් නිර්මාණය කරන ලද අභියෝගවලට මුහුණ දිය හැකි ක්‍රියාකාරකම්වල නිරතවීම හා සිසුන් එවැනි ක්‍රියාකාරකම්වල නිරත කර වීම.

**7.0** මෙම ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීති මාලාව කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කොට එහි විධිවිධාන පරිදි කටයුතු කිරීමට වගබලාගන්නා මෙන් කාරුණිකව දනුම් දෙමි.



එස්. එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:- 01. ජනාධිපති ලේකම්
02. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
03. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
04. විභාග කොමසාරිස් ජනරාල්
05. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
06. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
07. සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
08. සියලුම ගුරු විදුහල්පතිවරුන්